වාර්ෂික වාර්තාව

2020

සීමාසහිත සීනෝර් පදනම

නො. 335, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10

(ධීවර අමාත්‍යාංශය.)

අන්තර්ගතය

	පිටු අංක
ආයතනික තොරතුරු	03 – 05
දැක්ම, මෙහෙවර සහ අරමුණු	06
හැඳින්වීම	07
සභාපතිතුමාගේ සමාලෝචනය	08 – 09
අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	10 – 11
2020 වර්ෂය තුළ ලබාගත් ජයග්‍රහණ	12 – 14
2020 වර්ෂයේ මූල්‍ය කාර්යය සාධනය	15
නිෂ්පාදන වර්ගීකරණ	16 – 21
අනාගත සැලසුම්	22 – 23
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව	24 – 35
මූල්‍ය ප්‍රකාශන	36 – 62

- **සමාගමේ නම සහ ලිපිනය**

  සීමාසහිත සීනෝර් පදනම
  නො: 335, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10

- **නෛතික පසුබිම**

  1982 අංක 17 දරණ සමාගම් පනතට හා අනතුරුව 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුල සංස්ථාගත කල සමාගමකි.

- **අධ්‍යක්ෂ මණ්ඩලය**

ඒ. පී. රාජ් චන්ද්‍රලාල් මයා	-	සභාපති
බී. එම්. ඩී. එන්. බාලසූරිය මිය	-	අධ්‍යක්ෂ (මහා භාණ්ඩාගාර නියෝජිත)
ප්‍රභාත් ද සිල්වා මයා	-	අධ්‍යක්ෂ
ඒ. ඩී. නිමල් ධර්මරත්න මයා	-	අධ්‍යක්ෂ
කේ. විග්නේෂ්වරන් මයා	-	අධ්‍යක්ෂ
ඊ. අන්නලිංගම් මයා	-	අධ්‍යක්ෂ

- **සමාගම් ලේකම්**

  ආනන්ද සිරිසේන සහ සමාගම,
  නො. 70/2/3B/ දෙවන මහල,
  වයි. එම්. බී. ඒ. ගොඩනැගිල්ල,
  ඩී. එස්. සේනානායක මාවත,
  බොරැල්ල.

- **විගණකවරු**

  විගණකාධිපති දෙපාර්තමේන්තුව,
  අංක 306/72, පොල්දූව පාර,
  බත්තරමුල්ල.

- **බැංකුකරුවෝ**

  ලංකා බැංකුව,
  ආයතනික ශාඛාව,
  කොළඹ 01.

  හැටන් නැෂනල් බැංකුව,
  නගර ශාඛාව,
  කොළඹ 01.

  මහජන බැංකුව,
  රැජින ශාඛාව,
  කොළඹ 10.

- **බෝට්ටු යාත්‍රාංගන**

මට්ටක්කුලිය බෝට්ටු යාත්‍රාංගනය,
නො. 25, හැඳල තොටුපල පාර,
මට්ටක්කුලිය,
කොළඹ 15.

මට්ටක්කුලිය බෝට්ටු යාත්‍රාංගනය, (කැළණි ගග අසබඩ)
නො. 135, හැඳල තොටුපල පාර,
මට්ටක්කුලිය,
කොළඹ 15.

සීනෝර් බෝට්ටු යාත්‍රාංගනය,
කරෛනගර්.

- **ISO තත්ත්ව සහතිකය**

2009 වර්ෂයේ සිට බෝට්ටු නිෂ්පාදනය පිළබඳ ISO 9001 – 2015 තත්ත්ව සහතිකය පිරිනමන ලද රාජ්‍ය සමාගමකි.

- **හවුල් ව්‍යාපාර**

සීනෝර් ඔරියන්ට් මුහුදු කෑම අවන්හල, -
නො. 335, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

සීමාසහිත සීනෝර් පදනම සහ සීනෝර් ඔරියන්ට් පර්ල් සමාගම සමග අවුරුදු 20 කට අදාලව පැවැති හවුල් ගිවිසුම 2018.07.04 වන දිනෙන් අවසන් විය. ගිවිසුම්කාර පාර්ශවය විසින් Writ 226/2018 අංක ඇතිව 2018.07.06 වන දින අභියාචනාධිකරණයේ පවරන ලද නඩුව මේ වන විට විභාග වෙමින් පවතී.

මත්තුමගල කාර්මික වැඩහල, -
නො. 31 A, ගල් උඩුපිට පාර,
මත්තුමග

සීමාසහිත සීනෝර් පදනම සහ ෆ්‍රොන්ටියර් ඔටෝ මෝට්ව් පුද්ගලික සමාගම සමග 2006 අගෝස්තු මස 17 වන දින සිට 2021 අගෝස්තු මස 16 වන දින දක්වා අවුරුදු 15 ක කාල සීමාවක් සඳහා ව්‍යාපාරයෙහි ලාභ බෙදා ගැනීමේ සහ මාසිකව කුලියක් ලබා දීමේ පදනම මත අත්සන් කරන ලද කළමනාකරණ ගිවිසුමක් යටතේ ක්‍රියාත්මක වේ.

සීනෝර් පදනම සතු වර්ග අඩි 25,000 කින් යුත් ගබඩා සංකීර්ණය,
නො. 25, හැඳල තොටුපොල පාර,
මට්ටක්කුලිය,
කොළඹ 15.

\- සීමාසහිත සීනෝර් පදනම අන්වරලි ඇන්ඩ් සන්ස් පුද්ගලික සමාගම සමග 2017 පෙබරවාරි මස 08 වන දින සිට 2022 පෙබරවාරි මස 08 වන දින දක්වා අවුරුදු 05 ක කාල සීමාවකට මාසික කුලී පදනම මත ලබා දී ඇත.

දැක්ම, මෙහෙවර, අරමුණු

- **දැක්ම**

ශ්‍රී ලංකාව තුළ ධීවර යාත්‍රා සහ විනෝද යාත්‍රා නිෂ්පාදනයේ මෙන්ම අනෙකුත් ෆයිබර්ග්ලාස් ආශ්‍රිත නිෂ්පාදන වල ප්‍රමුඛයා බවට පත් වීම හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් යාත්‍රා නිෂ්පාදකයෙකු බවට පත් වීම.

- **මෙහෙවර**

තරඟකාරී මිල ගණන් යටතේ ඉහළ ප්‍රමිතියකින් යුතු ධීවර යාත්‍රා සහ ධීවර ආම්පන්න සපයන කාර්යක්ෂම හා ඵලදායී ආයතනයක් ලෙස කටයුතු කිරීම.

- **අරමුණු**

❖ ෆයිබර්ග්ලාස් බෝට්ටු අපනයනයේ පිළිගත් අපනයනකරුවෙකු බවට පත්වීම.

❖ ජාත්‍යන්තරයේ කීර්තිමත් ෆයිබර්ග්ලාස් බෝට්ටු නිෂ්පාදකයෙකු බවට පත්වීම.

❖ විදේශ රටවල් තුළ ෆයිබර්ග්ලාස් බෝට්ටු නිෂ්පාදනයේ ආයෝජිතයෙකු බවට පත්වීම.

❖ විශිෂ්ඨ පාරිභෝගික සේවා සපයන්නෙකු වීම.

❖ ඉහළ ප්‍රමිතියකින් යුතු ධීවර බෝට්ටු සහ ධීවර ආම්පන්න සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමේ වඩාත් ඵලදායී අනුග්‍රාහකයෙකු වීම.

හැඳින්වීම

ශ්‍රී ලාංකීය ධීවර ප්‍රජාවගේ අධ්‍යාපන සහ සුභ සාධක කටයුතු ඉහළ නැංවීමේ අරමුණින් 1967 නෝර්වේජියානු රාජ්‍ය නොවන සංවිධානයක ආධාර මත ලාභ අරමුණු කර නොගත් රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස සීනෝර් සංවර්ධන පදනම ආරම්භ කරන ලදී. අනතුරුව 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට පවරාගත් වෙළඳ ව්‍යාපාර පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ සීනෝර් සංවර්ධන පදනම **"සීමාසහිත සීනෝර් පදනම"** ලෙස සංස්ථාගත කර ඇත. ආරම්භයේ සිට කාලයාගේ ඇවෑමෙන් මෙම සංවිධාන ව්‍යුහයෙහි සිදු වූ වෙනස්කම් පහත පරිදි දක්වා ඇත.

1967 නෝර්වේජියානු රාජ්‍ය නොවන සංවිධානයක් වන නෝර්වේ ගොඩිටෙම්ප්ලර් උන්ග්ඩෝම්ස් පෙර්බන්ඩ් වෙතින් ලත් ආධාර ප්‍රයෝජනයට ගනිමින් සීනෝර් සංවර්ධන පදනම පිහිටුවා එහි කටයුතු ඇරඹීය.

1971 1938 අංක 51 දරණ සමාගම් ආඥා පනත යටතේ ඇපයෙන් සීමිත පොදු සමාගමක් ලෙස සංස්ථාගත කොට සීමාසහිත සීනෝර් සංවර්ධන පදනම යන නමින් හැඳින්වීය.

1985 ශ්‍රී ලංකා රජය විසින් 1971 අංක 35 දරණ වෙළඳ ව්‍යාපාර පවරා ගැනීමේ පනත යටතේ රජයට පවරාගත් අතර රජයට පවරාගත් සීමාසහිත සීනෝර් සංවර්ධන පදනම නමින් හැඳින්වීය.

1990 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට පවරාගත් වෙළඳ ව්‍යාපාර පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත ක්‍රියාත්මක වීමෙන් රජයට පවරාගත් සීමාසහිත සීනෝර් සංවර්ධන පදනම අහෝසි වී එහි අනුප්‍රාප්තිකයා ලෙස කටයුතු කිරීමට 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 1990.01.17 වන දින සීමාසහිත සීනෝර් පදනම සංස්ථාගත කරනු ලැබ ඇත.

මෙම නව සමාගමේ සම්පූර්ණ කොටස් ප්‍රාග්ධනය (රු. 40,000,000/-) භාණ්ඩාගාරයේ ලේකම් වෙත වෙන් කර ඇත.

2011 අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයකට අනුව සීමාසහිත සීනෝර් පදනම යටතේ පැවැති ලුණුවිල සහ වීරවිල මාළුදැල් කර්මාන්ත ශාලා දෙක 2011 නොවැම්බර් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යාම සඳහා සීමාසහිත නෝර්ත් සී ආයතනයට පවරා දී ඇති අතර නෝර්ත් සී ආයතනය යටතේ පැවැති යුද්ධයෙන් විනාශ වූ කරෙරනගර් බෝට්ටු යාත්‍රාංගනය සීනෝර් පදනම වෙත පවරා දී ඇත.

2013 දික්ඕවිට ධීවර වරාය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට සමගාමීව සියලුම ධීවර සහ විනෝද යාත්‍රා නිෂ්පාදනය සඳහා මට්ටක්කුලිය යාත්‍රාංගනය වැඩි දියුණු කිරීම.

සභාපතිතුමාගේ සමාලෝචනය

සීමාසහිත සීනෝර් පදනමේ අභිවෘද්ධිය සඳහා අප විසින් 2019 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල සාර්ථකත්වය සහ එමගින් අත්පත් කරගත් ප්‍රතිඵල මූලික කොටගෙන අප විසින් සිදු කරන ලද ධීවර යාත්‍රා සහ ඒ ආශ්‍රිත උපකරණ නිෂ්පාදනය 2020 වර්ෂය සඳහා ද එලෙසම පවත්වාගෙන යමින් සාර්ථකව නිම කරන ලද 2020 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂයේ වාර්ෂික වාර්තාව සීනෝර් පදනමේ සභාපතිවරයා ලෙස අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරමි.

2020 වර්ෂයේ ප්‍රථම කාර්තුවේ සිට සමස්ථ රටටම ඉතාමත් අවාසනාවන්ත ලෙස බලපෑම් ඇතිකල කොවිඩ් - 19 වසංගතය මධ්‍යයේ නිෂ්පාදන ආයතනයක් වන සීනෝර් පදනමෙහි මූල්‍ය, නිෂ්පාදන, සැපයුම් අංශ ඇතුළු සමස්ථ ක්‍රියාපටිපාටියෙහි අඛණ්ඩව පවත්වාගෙන යාම දැඩි ලෙස දුෂ්කර වූවද සංචාරක ක්ෂේත්‍රය උදෙසා තල්මසුන් නැරඹීමේ යාත්‍රාවක නිෂ්පාදන කටයුතු අවසන් කර දියත් කරවීමට හැකිවීම අප ලද ජයග්‍රහණයක් ලෙස දකිමි. කෙසේ වූවද කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ධීවර හා සංචාරක ක්ෂේත්‍රයන්හි ඇති වූ පසුබෑම හේතුවෙන් එහි සෘජු බලපෑමට ලක්වන අපහටද අපේක්ෂිත ආයතනික අරමුණු හා ලාභදායී තත්වයනට ලඟා වීමට නොහැකි විය.

එවැනි ආර්ථිකමය බාධා හමුවේ වුවද සියළු සේවක වැටුප් හා වේතනද, ව්‍යවස්ථාපිත ගෙවීම්ද පැහැර හැරීමකින් තොරව නිසියාකාරයෙන් ගෙවා ආයතනයේ හා සේවකයන්ගේ ඉදිරි ගමන් මග ස්ථාවර කර ගැනීමට හැකියාව ලැබීම පිළිබඳව ආයතනයේ සභාපතිවරයා වශයෙන් මා නිහතමානී ලෙස ආඩම්බර වෙමි.

ඒ අනුව 2020 වර්ෂයේ පිළිවෙලින් රු. මි. 36.756, රු. මි. 30.225, රු. මි. 12.899 යනාදී ආයතනික නිෂ්පාදන, අනෙකුත් මෙහෙයුම් සහ භාණ්ඩ මිලදී ගෙන විකිණීම හරහා රු. මි. 79.881 ක දළ ආදායමක් ලැබුවද වර්ෂ අවසානයේදී අපේක්ෂිත අරමුණ වූ ලාභ ඉපයීමක් සිදු කර ගැනීමට නොහැකි විය. ඒ අනුව 2020 වසරේ බදු පසු ශුද්ධ අලාභය රු. මි. 21.971 කි.

සීනෝර් පදනම මුදල් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන නොලබන ආයතනයක් වූවද ධීවර ජනතාවට ඉහළ සේවයක් ඉටු කිරීමේ අරමුණින් අවම ලාභාංශයක් ඇතිව ක්‍රියාත්මක වන අප ආයතනය පහතින් දැක්වෙන නිෂ්පාදන ඔස්සේ ධීවර ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් කටයුතු කර ඇත.

- අනුරාධපුර පළාත් සභාව සඳහා රු. මි. 2.1 කට සජීවී මාළු ප්‍රවාහන පෙට්ටි නිෂ්පාදනය කර ලබා දීම.
- 50% සහනාධාර මත අඩි 59.5 ක් දිගැති බහුදින ධීවර යාත්‍රාවක් නිෂ්පාදනය කර ලබා දීම.
- සංචාරක ක්ෂේත්‍රය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණින් තල්මසුන් නැරඹීමේ යාත්‍රා 01 ක් මිරිස්ස ප්‍රදේශයේ ගැණුම්කරුවකු සඳහා නිෂ්පාදනය කර ලබා දීම.

- යාපනය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ෆයිබර්ග්ලාස් අත්සේදුම් බේසම් සඳහා රු. මිලියනයක් පමණ වටිනා ඇණවුමක් ලද අතර එම ඇණවුම සාර්ථකව නිම කර යාපනය දිස්ත්‍රික්කයේ සියළුම පාසල් වෙත බෙදාහැරීම් කිරීම සිදු කරන ලදී.

- NAQDA ආයතනය වෙතින් රු. මි. 3.5 ක ඔරු සමහ කොල්ලෑ නිෂ්පාදනය සඳහා ඇණවුමක් ලබා දී ඇත.

- විශ්ව පාරමී ආයතනය වෙතින් රු. මි. 23.8 ක සීමා මාලක ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා අවස්ථාව ලබා දී ඇත.

තවද 2019 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවේ සඳහන් කොට ඇති අපගේ පද්ධති හා පාලන වල පවතින දුර්වලතා නිවැරදි කිරීමට 2020 වර්ෂය තුලදී කටයුතු කර ඇති බවද දන්වා සිටිමි.

2020 වර්ෂය තුලදී අප සමාගමෙහි සියලු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මග පෙන්වූ ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය ඩග්ලස් දේවානන්ද මැතිතුමාට සහ එම අමාත්‍යාශයේ ලේකම්තුමාටත්, අමාත්‍යාංශයේ සේවක මඩුල්ලටත් මාගේ ස්තුතිය පල කර සිටිමි. ඒ වාගේම විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධනය, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍ය ගරු කංචන විජේසේකර මැතිතුමාටත්, එම අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, රාජ්‍ය අමාත්‍යාංශයේ සේවක මඩුල්ලටත්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ එම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටද මාගේ ස්තුතිය පිරිනමමි. අපහට ලබා දෙන ලද සියලු කාර්යයන් 2020 වර්ෂයේදී සාක්ෂාත් කර ගැනීමට නොමද සහායක් ලබා දුන් සීනෝර් පදනමෙහි අධ්‍යක්ෂක මණ්ඩලයටත්, වැ.බ. සාමාන්‍යාධිකාරීතුමා ඇතුළු සේවක මණ්ඩලයට ද මාගේ ස්තුතිය පුද කරමි.

....

අමිල රත්මණ්ඩල
සභාපති
සීමාසහිත සීනෝර් පදනම.

2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

01. විගණනය කරන ලද ගිණුම්

2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කර ඇත.

02. මූල්‍ය ප්‍රථිපල

වර්ෂයේ ශුද්ධ ලාභය / (අලාභය) පිටු අංක 42 හි සමස්ථ ආදායම පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා ඇත.

03. පවත්නා තත්ත්වය

සමාගමේ පවත්නා තත්ත්වය පිටු අංක 43 හි දක්වා ඇත.

04. මූලික මෙහෙයුම් කාර්යයන්

2020 වර්ෂයෙහි සමාගමේ මූලික මෙහෙයුම් කාර්යයන් පහත පරිදි දැක්වේ.

- සියලු පහසුකම් වලින් සමන්විත ෆයිබර්ග්ලාස් බහුදින ධීවර යාත්‍රා නිෂ්පාදනය.
- ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය මාළු පෙට්ටි, අලෙවි කුටි සහ ආරක්ෂක කුටි නිෂ්පාදනය කිරීම.
- මිරිදිය ධීවර කර්මාන්තයට අවශ්‍ය ඔරු සහ කොල්ලෑ නිෂ්පාදනය කිරීම.
- ධීවර ක්ෂේත්‍රයට අවශ්‍ය මාළු දැල් සහ ඒ ආශ්‍රිත උපකරණ මිලදී ගැනීම සහ විකිණීම් කටයුතු සිදු කිරීම.
- සංචාරක ක්ෂේත්‍රයට අවශ්‍ය විනෝද යාත්‍රා සහ තල්මසුන් නැරඹීමේ යාත්‍රා නිෂ්පාදනය කිරීම.

05. ලාභාංශ

2020 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලාභාංශ ප්‍රකාශ කර නොමැත.

06. සමාගම සමග යෝජිත කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන්ගේ සබැඳියාව

2020 වර්ෂය තුළ සමාගමේ අධ්‍යක්ෂකවරුන් සමග කොන්ත්‍රාත් සබැඳියාවක් නොමැත.

07. සමාගමේ කොටස් සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන්ගේ සබැඳියාව

2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂකවරයෙකු සතු වූ කොටස් නොමැත.

08. ප්‍රමාණාත්මක කොටස් හිමිකම

ශේෂපත්‍ර දිනට සමාගමේ නිකුත් කල කොටස් ප්‍රාග්ධනයෙන් 100% ක් මහාභාණ්ඩාගාරයේ ලේකම් සතුව පවතී.

09. පුණ්‍යායථනයන්ට ආධාර කිරීම්

2020 වර්ෂය තුළදී සමාගම විසින් කිසිම පුණ්‍යාධාර ආයතනයකට හෝ දේශපාලන කරුණු සඳහා කිසිම දායකත්වයක් සපයා නොමැත.

10. දේපළ පිරියත හා යන්ත්‍රෝපකරණ වල වෙනස්වීම්

පිටු අංක 57 හි, උපලේඛනයේ දක්වා ඇති පරිදි දේපළ පිරියත හා යන්ත්‍රෝපකරණ සංචලනය වී ඇත.

වර්ෂය ආරම්භයේ සිට මේ දක්වා සමාගම සතු බැංකු පහසුකම් අවශ්‍යතා අඛණ්ඩව සපයන සමාගමේ බැංකුකරුවන් ආරක්ෂිත ඇපකර මත තවදුරටත් මෙම පහසුකම කරන බව විශ්වාස කර ඇත.

12. විගණකවරුන් පත් කිරීම

19 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ සීමාසහිත සීනෝර් පදනම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණනයට යටත් වේ.

13. මානව සම්පත

2020 දෙසැම්බර් 31 වන දිනට සීමාසහිත සීනෝර් පදනමෙහි මුළු සේවක මඩුල්ල පහත පරිදි වේ.

01. ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	-	-
02. කළමනාකරුවන්	-	05
03. කණිෂ්ඨ කළමනාකරුවන්	-	02
04. කළමනාකාර සහකාරවරුන්	-	22
05. ප්‍රාථමික ශිල්පීය හා ශිල්පීය නොවන සේවකයින්	-	43

14. 2020 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය

ඒ. පී. රාජ් චන්ද්‍රලාල් මයා	-	සභාපති
බී. එම්. ඩී. එන්. බාලසූරිය මිය	-	අධ්‍යක්ෂ (මහා භාණ්ඩාගාර නියෝජිත)
ප්‍රභාත් ද සිල්වා මයා	-	අධ්‍යක්ෂ
ඒ. ඩී. නිමල් ධර්මරත්න මයා	-	අධ්‍යක්ෂ
කේ විග්නේෂ්වරන් මයා	-	අධ්‍යක්ෂ
ඊ. අන්නලිංගම් මයා	-	අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

....

අමිල රන්මණ්ඩල

සභාපති

සීමාසහිත සීනෝර් පදනම.

....

සාලිකා ටී. වඩුතන්ත්‍රි

සමාගම් ලේකම්.

2020 වර්ෂය තුළදී ලබාගත් ජයග්‍රහණ

2020 වර්ෂය තුල දී සීනෝර් ආයතනය වෙත මිරිස්ස ප්‍රදේශයේ ගනුදෙනුකාර භවතකු වෙත අඩි 50 ක් දිගින් යුක්ත තල්මසුන් නැරඹීමේ යාත්‍රාවක් (ෆයිබර්ග්ලාස්) සඳහා ඇණවුමක් ලද අතර එම ඇණවුම සාර්ථකව මෙම වසර තුළ දී භාර දෙන ලද අතර එය **"ගින්දර"** යන නමින් මේ වන විට මෙහෙයුම් කටයුතු වල නිරත වෙමින් පවතී.

සී නෝර් ආයතනය විසින් කොවිඩ් වසංගත කාල සීමාව තුළ දී ෆයිබර්ග්ලාස් අමුද්‍රව්‍ය යොදා ගනිමින් පාද මඟින් ක්‍රියාත්මක කළ හැකි අත් සෝදන බේසම් විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම් කරන ලද අතර මලකඩ ඇති වීමෙහි සම්භාවිතාව අවම නිසා මුහුදු බඩ ප්‍රදේශ ආශ්‍රිතව ඒ වෙනුවෙන් විශාල ඉල්ලුමක් ද පැවතිනි.

යාපනය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ෆයිබර්ග්ලාස් අත්සේදුම් බේසම් සඳහා රු. මිලියන 01 ක් පමණ වටිනා ඇණවුමක් ලද අතර එම ඇණවුම සාර්ථකව නිම කර යාපනය දිස්ත්‍රික්කයේ සියළුම පාසල් වෙත බෙදාහැරීම් කිරීම සිදු කරන ලදි.

2020 වර්ෂය තුල ව්‍යාප්ත වූ කොරෝනා වසංගත තත්වය හේතුවෙන් රට සම්පූර්ණයෙන්ම වසා දැමීමට කටයුතු කල අතර ඒ හේතුවෙන් සීනෝර් ආයතනයද මාස කිහිපයක් සඳහා සම්පූර්ණයෙන්ම වසා තැබීමට සිදු වූ වටපිටාවක් තුල වුව ද රාජ්‍ය ආයතන මඟින් අප කෙරෙහි තැබූ විශ්වාසය මත පදනම් ව විශාල ඇණවුම් ප්‍රමාණයක් ලැබුණු බව ඉතා සතුටින් යුතුව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

ඉහත සඳහන් කරුණු වලට අමතරව 2020 වර්ෂය තුළ දී අප සමාගම විසින් නිෂ්පාදනය කරන ලද සියලු භාණ්ඩ වල සවිස්තරාත්මක විස්තරයක් පහත වගුවේ දක්වා ඇත.

අංකය	නිෂ්පාදන වර්ගය	ප්‍රමාණය
1.	සෂිමි යාත්‍රා	01
2.	ඔරු	70
3.	ෆයිබර්ග්ලාස් පාවෙන පාලම/ මගී පාලම	02
4.	කොල්ලෑ	74
5.	පැඩල් බෝට්ටු	07
6.	බහුදින යාත්‍රා (අඩි 55 සහ අඩි 59.5)	01
7.	අත් සෝදන බේසම්	12
8.	අයිස් පෙට්ටි	201
9.	විනෝද යාත්‍රා	01
10.	ලයිව් ටැන්ක්ස්	01
11.	මාළු බකට්	20
12.	ෆයිබර් ටැන්ක්	11
13.	තෙප්පම්	01
එකතුව		**402**

2020 වර්ෂයේ මූල්‍ය කාර්යය සාධනය

සී/ස සී නෝර් පදනම සාර්ථකව ව්‍යාපාර කටයුතු කළමණාකරනය කල අතර අයහපත් කොරෝනා වසංගතයකට මුහුණ දීමට සිදු වීමත් සමඟ 2020 මූල්‍ය වර්ෂය තුළ දී රු.20,957,072.65 ක මූල්‍යමය අලාභයකට මුහුණ දීමට සිදු වී ඇත. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ධීවර අමාත්‍යාංශය සහ අනෙකුත් රජයේ ආයතන මෙන්ම පුද්ගලික ආයතන මඟින් ද ඇණවුම් විශාල ප්‍රමාණයක් ලැබු නමුත් සාර්ථක ලෙස ඒවා නිම කරගැනීමට නොහැකි වීමත් සමඟ 2020 වර්ෂය තුළ දී ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය.

අනු අංකය	විස්තරය	පිරිවැටුම
01	සමාගමේ නිෂ්පාදන මගින් ලැබූ ආදායම	රු. 36,756,116.44
02	අනෙකුත් මෙහෙයුම් ආදායම	රු. 32,658,471.07
03	මිලදී ගැනීම් සහ විකිණීම මගින් ලැබූ ආදායම	රු. 12,899,835.60
	මුළු ආදායම	**රු. 82,314,423.11**

වගුව 4

පසුගිය වසර 5 තුල කැපී පෙනෙන මූල්‍ය තත්ත්වයන්

විස්තරය	2016	2017	2018	2019	2020
මුළු ආදායම	192.892	1060.63	263.91	124.01	82.314
දළ ලාභය (අලාභය)	10.935	170.56	19.35	5.77	-14.533
ශුද්ධ ලාභය (අලාභය) බදු වලට පසු	9.264	89.35	(54.68)	(23.77)	-20.957
කොටසක ඉපයීම	2.32	22.34	(13.67)	(5.94)	-0.52
ස්ථාවර වත්කම් (ශුද්ධ පොත් අගය)	321.674	346.42	321.67	430.24	415.228
ස්ථාවර තැන්පත්	1.30	1.30	12.00	12.00	12.00
ජංගම වත්කම්	310.974	445.25	205.4	206.7	198.098
ජංගම වගකීම්	190.223	431.48	117.6	139.6	152.175
ජංගම නොවන වගකීම්	52.368	41.25	35.05	173.4	157.220
කොටස් ප්‍රාග්ධනය	40.00	40.00	40.00	40.00	40.00
අනෙකුත් සංචිත සමග ප්‍රාග්ධනය	391.988	320.91	349.6	325.9	304.944

59.5 ft Long Line Multiday Fishing Boat

Specification

Length	18m
Beam	5.20m
Draft	1.60m
Fuel	14000l
Water	4500l
Fish hold capacity	45.0cu.m
Engine capacity	410 hp

LKR 35 M ($ 172,567)

Long Line Multiday Fishing Boat (55ft)

Specification

Length	16.764m
Beam	5.03m
Draft	1.8m - 2.05m
Fish hold capacity	29m3 - 35m3
Fuel	10,000- 14000l
Water	5,000-6000l
Speed	9kmph
Engine capacity	320 -410 hp

LKR 33M ($ 162,706)

Trimaran – Whale Watching Boat (50ft)

LKR 28 M ($ 138,053)

Specification

Length	15.24m
Beam	5.30m
Draft	1.05m
Main Hull Beam	2.30m
Fuel	2,400l - 3,000l
Water	1000 -1500l
Seating Capacity	5.30m
Speed	9-11 kmph
Beds	01
Fish hold capacity	01
Engine capacity	250hp

Ambulance Boat (32ft) – without engine

LKR 12 M ($ 59,166)

Specification

Length	32ft 3in
Beam	10ft 2in
Draft	3ft
Fuel	750l
Cupboard	3
Water	150l
Oxygen cylinder holder	02
Hooks for seyline bottle	02
Seats	03
Bench for 4 people	01
Sink and water tap	01
Cloth hanger	01
Empty box first aid	01
Emergency ladder s/s	01
Rexin covered mattress for beds	02
Toilet with water	01

Leisure Boat (24ft) – without engine

Specification

Length	7.3m
Beam	2.24
Depth	0.16m
Draft	0.45m

SS canopy with sunbrella cloth

LKR 03 M ($ 14,791)

Flat Bottom Boat (18 1/2ft - 19 1/2ft) – without engine

Specification

Length	18ft 5in - 19ft 6in
Beam	6ft 5in - 6ft 6in
Depth	2ft 6in - 2ft 9in
Draft	5in

Slow board winch SS canopy with sunbrella cloth

LKR 360,000/- ($ 1,775)

13ft – 19ft CeyNor-Genso Solar Boat

LKR 950,000/- ($ 4,684)

Fiberglass 18 ½ feet and 15 ½ feet

18 ½ Feet - LKR 88,000/- ($434)

15 ½ Feet - LKR 85,000/- ($419)

Paddle Boat

Specification

Length	7ft 8in
Beam	5ft 1in
Depth at mid	1ft
Seating capacity	02 person
Canopy with sunbrella cloth	01

LKR 375,000/- ($ 1,850)

Fish Stall

LKR 340,000/- ($1,676)

Specification

Length	72in
Width	48in
Height	84in
Ice box	36in x 18in x 24in
Fish display tray	02
Swing doors	02

New design for House Boat/Floating Restaurant

Specification

Overall Length	36'
Beam	18'-8'
Draft	0.2m

Options

Mini Bar
Kitchen/ Open Pantry
Toilets/Changing Room/Bath room
Tables
Chairs
Solar roof

LKR 16,000,000/- ($ 78,888)

Mobile Toilet (double)	LKR 350,000/- ($ 2406)
Security Hut	LKR 430,000/- ($ 2,120)
Fish Keeping Ice Box	LKR 25,000- 220,000 ($ 123-1085)
Fish Pallet	LKR 28,000/- ($ 138)
Life Ring	LKR 8,000/- ($ 39)
Life Jacket	LKR 4,000/- ($ 19.7)

25 5 2006

01. අඩි 49.5 ධීවර යාත්‍රා සඳහා දෙමුහුන් ඩීසල් එන්ජින් හඳුන්වා දී එන්ජින් සැපයීම සඳහා මැදිහත් වීම.

පුනර්ජනනීය බලශක්තිය යොදාගනිමින් අඩි 49.5 යාත්‍රා සඳහා දෙමුහුන් ඩීසල් එන්ජින් හඳුන්වා දීමට සැලසුම් සකස් කර ඇත. මෙමගින් ධීවර ප්‍රජාව වෙත ප්‍රතිලාභ රැසක් සැලසෙන අතර ඉන්ධන පිරිවැය අවම වීම මෙන්ම ඉන්ධන මගින් වන පරිසර හානියද අවම කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.



Marine Diesel Hybrid Engine

02. නිල් තල්මසුන් නැරඹීමේ යාත්‍රා තාක්ෂණික හා නවීන අංගෝපාංග වලින් වෙළඳපලට හඳුන්වා දීම.

ධීවර කර්මාන්තය මත පමණක් පදනම් නොවී සමුද්‍ර සංචාරක කර්මාන්තයේ සංවර්ධනය පිළිබඳව සැලකිල්ලට ගනිමින් අප විසින් නිෂ්පාදනය කරනු ලබන නිල් තල්මසුන් නැරඹීමේ යාත්‍රා සඳහා නවීන උපාංග හා සංචාරකයින්ට වැඩි පහසුකම් සහිතව, තාක්ෂණික අංග හඳුන්වා දීම තුළින් සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත ආදායම් ඉහළ නංවා ගැනීමට බලාපොරොත්තු වේ.

03. Underwater Restaurant.

දියඹ යට සිට නැරඹීමේ පහසුකම් සහිත අද්විතීය යාත්‍රාවක් තුළ වූ අවන්හලක් නිර්මාණය කිරීමට අප ආයතනය මගින් බලාපොරොත්තු වේ. මේ තුළින් සංචාරකයින්හට නැවුම් අත්දැකීමක් ලබා දී වැඩි ආකර්ෂණයක් ලබා ගැනීම බලාපොරොත්තු වේ.

Under water Restaurant

04. ෆයිබර්ග්ලාස් ප්‍රතිචක්‍රීකරණය තුළින් විවිධාංගීකරණය.

ෆයිබර්ග්ලාස් අපද්‍රව්‍ය හේතුවෙන් බලපා ඇති සාගර වල ජනගහනය අඩු වීමට පිළියමක් ලෙස ෆයිබර්ග්ලාස් ප්‍රතිනිර්මාණය කිරීමට හැකි ප්‍රතිචක්‍රීකරණ කම්හලක් පිහිටුවීමට අප ආයතනය විසින් සැලසුම් සකස් කරමින් පවතී. මෙම Fiber Dust යොදා ගනිමින් අතුරු නිෂ්පාදන හඳුන්වාදීම මගින් සාගර හා පාරිසරික ගැටළු අවම කර ගැනීමටද අමතර ආදායමක් ජනනය කර ගැනීමට ද බලාපොරොත්තු වේ.



By-products

Fiberglass crushing machine

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එෆ්එල්එස්/බී/සීඑන්එෆ්එල්/6/20/1 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 මාර්තු 10 දින

සභාපති

සීමාසහිත සීනෝර් පදනම

සීමාසහිත සීනෝර් පදනමේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් :- ලේකම් - ධීවර අමාත්‍යාංශය

ලේකම් - මුදල් අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්එල්එස්/බී/සීඑන්එෆ්එල්/6/20/1 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 මාර්තු 10 දින

සභාපති

සීමාසහිත සීනෝර් පදනම

සීමාසහිත සීනෝර් පදනමේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත සීනෝර් පදනමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, පදනමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2020 දෙසැම්බර් 31 දිනට රු.34,354,796 ක් වූ වෙළඳ ණයගැති ශේෂය තුළ ණයගැතියන් 39 දෙනෙකුට අදාල එකතුව රු.22,920,383ක් වූ සෘණ ශේෂයන් පැවතිය ද අදාල ශේෂයන්වල පැවැත්ම හා නිරවද්‍යතාවය විගණනයේ දී තහවුරු කරගැනීමට නොහැකි විය.

(ආ) 2015, 2016, 2017, 2019 හා 2020 වර්ෂයන්ට අදාළ විගණන පාරිශ්‍රමිකවල එකතුව වූ රු.2,097,100ක් ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස පෙන්වනු වෙනුවට රු.586,000ක් පමණක් ගෙවිය යුතු ලෙස පෙන්වා රු.1,511,100 ක් වෙළඳ ණයහිමි ලෙස දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ දේපල පිරියත හා උපකරණවල මුළු ක්ෂය ප්‍රමාණය රු.34,468,137ක් වුවද ආදායම් ප්‍රකාශනයට අනුව ආදායමට එරෙහිව ලියාහරින ලද ක්ෂය ප්‍රමාණය රු.17,028,850ක් වීම හේතුවෙන් වාර්ෂික අලාභය රු.17,439,287ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂය සඳහා ආයෝජන දේපල ආදායම් රු.16,030,000 ක් ලෙස දක්වා තිබුණ ද මූල්‍ය ප්‍රකාශනවල සටහන් 29 අනුව ආයෝජන දේපලවලින් කුලී ආදායම ලෙස රු.16,200,000 ක් දක්වා තිබුණ හෙයින් රු.170,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් ගණනය කිරීමේ ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයට අදාල සේවක ප්‍රතිලාභ වෙන්කිරීම රු.3,622,717ක් වියයුතු වුවත්, පරිපාලන වියදම් යටතේ සේවක ප්‍රතිලාභ ලෙස රු.2,508,538ක් දැක්වීම හා සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් රු.1,114,179ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2007 වර්ෂයේ සිට 2014 වර්ෂයන්ට අදාලව වූ රු.2,466,894 ක ආර්ථික සේවා ගාස්තු 2019 වර්ෂයේ දී ගෙවිය යුතු ආදායම් බදු සඳහා හිලව් කිරීමේ කාලය ඉක්මවා ගොස් තිබුණු බැවින් වියදමක් ලෙස කපා හළ යුතුව තිබුණ ද ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු ගිණුමට හරකර තිබුණි. ඒ හේතුවෙන් ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු ගිණුමේ ශේෂය හා රඳවාගත් අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සංසන්දනාත්මක ශේෂවලට අනුව වර්ෂයේ ආරම්භක මුදල් හා මුදල් සමාන දෑ ශේෂය රු.30,889,606ක් විය යුතු වුවත් 2020 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසීමේදී එම අගය රු.30,308,312ක් ලෙස සලකා තිබුණු හෙයින් රු.581,294ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) වර්ෂය අවසානයට මුදල් හා මුදල්වලට සමාන දෑ වලට අදාල ලෙජර් ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.8,210,239ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.118,876,125ක් ලෙස දක්වා තිබුණු හෙයින් රු.110,665,886ක වෙනසක් විය. එසේම රු.26,000,000 ක්වූ කෙටිකාලීන ආයෝජන වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා නොතිබුණි.

(එ) දේපල පිරියත හා උපකරණවලට අදාල ක්ෂය රු.17,028,850 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම අගය රු.29,051,182ක් ලෙස ගණනය කර තිබීම හේතුවෙන් රු.12,022,332ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඒ) මූල්‍ය ප්‍රකාශයට අනුව තැන්පතු ගිණුම් ශේෂය රු.38,632,259 ක් වුවද ඉදිරිපත් කර තිබූ උපලේඛණයේ ශේෂය රු.40,582,517 ක් වූයෙන් රු.1,950,258ක වෙනසක් විය.

(ඔ) අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ එකතුකළ අගය මත බදු රු.18,518,684 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණු බැවින් එම ගිණුම එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණු අතර එයින් රු.11,719,949 ක් සඳහා උපලේඛනයක් ඉදිරිපත් නොවීය. තව ද අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ ජාතිය ගොඩනැගීමේ බදු ලෙස රු.10,406,699 ක් දක්වා තිබුණ ද ඒ සම්බන්ධයෙන් විගණනයට සාක්ෂි කිසිවක් ඉදිරිපත් නොකෙරුණි.

(ඕ) අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ වූ රු.118,570 ක්වූ යාපනය චන්දි ගිණුම, රඳවාගැනීමේ රු.2,938,166 ක්වූ ශේෂය, රු.364,711 ක්වූ නොඉල්ලූ වැටුප් හා වේතන ගිණුමේ ශේෂය සහ රු.412,620 ක්වූ නොඉල්ලූ පාරිතෝෂික ගිණුමේ ශේෂය තහවුරු කිරීමට සාක්ෂි හා නිරවුල් නොකිරීමට හේතු ඉදිරිපත් නොවීය. තව ද රු.60,973,187 ක් වූ විකුණුම් අත්තිකාරම්වලට අදාල උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීය.

(ක) අනෙකුත් ලැබිය යුතු දෑ යටතේ 2007 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වු වර්ෂවල සිට පැවත එන ගිණුම් 4ක ශේෂ එකතුව වූ රු.2,285,437කට අදාලව කිසිදු ලිඛිතමය සාක්ෂියක් පදනම සතුව නොතිබුණු අතර එම ශේෂයන් අයකර ගැනීම සඳහා ද කිසිදු ක්‍රියාමාර්ගයක් පදනම විසින් ගෙන නොතිබුණි.

(ග) ණයහිමි ශේෂ 02 ක කේවල ණයහිමි ශේෂය රු.1,583,598ක්වූ අතර ශේෂ සනාථන අනුව රු.2,351,654ක් වූයෙන් රු.768,056 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ච) 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.25,168,186 ක් වූ ණයහිමි කේවල ශේෂ 64 ක් හා රු.34,354,796 ක්වූ ණයගැති ශේෂ 197 ක් සම්බන්ධයෙන් ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් නොවීය.

(ජ) මූල්‍ය ප්‍රකාශනයෙහි අඩංගු අනෙකුත් ගෙවිය යුතු දෑ තුළ සී.එච්.එෆ්.සී.ආරක්ෂක (Security C.H.F.C) ලෙස රු.1,144,306 ක ශේෂයක් පෙන්නුම් කළ ද එම ශේෂය සනාථ කිරීම සඳහා ශේෂ සනාථන ඉදිරිපත් නොවීය.

(ට) 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු.4,119,056 ක ලැබිය යුතු රඳවා තබා ගැනීමේ බදු ශේෂය තුළ ඇතුළත් 2018 ජනවාරි 01 දිනට පෙර සිට පැවත එන රු.1,119,029 ක් වූ ශේෂය සඳහා රඳවා තබාගැනීමේ බදු සහතික විගණනයට ඉදිරිපත් නොවීය.

(ඩ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ නෝර්ත් සී පුද්ගලික සමාගම නමින් 2011 වර්ෂයේ සිට පැවත එමින් තිබුණු රු.9,204,498 ක ශේෂය වෙනුවෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 9 හි 5.5 ඡේදය ප්‍රකාරව හානිකරණ අලාභ හඳුනාගෙන නොතිබුණි.

(ත) තොග පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 - ප්‍රමිතයේ 28 පරිච්ඡේදය ප්‍රකාරව සෑම වර්ෂයක් අවසානයේදීම පවතින තොගයෙහි ශුද්ධ උපලබ්ධි අගය පිළිබඳ නව තක්සේරුවක් කර ඒ අනුව තොගයෙහි අගය ගැලපීම් කර නොතිබුණි.

(ද) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රකාරව සංචලනය නොවන හා හානි වූ රු.8,803,275 ක තොග සම්බන්ධයෙන් හානිකරණය සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

(න) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 (LKAS 16-දේපල පිරියත හා උපකරණ) හි 51 වන ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේ දීම සමාලෝචනය කළ යුතු වුවත් 2020 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය ශුන්‍ය වූ රු. 78,324,381ක දේපල පිරියත හා උපකරණ සඳහා අවශේෂ වටිනාකම හෝ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර නොතිබුණි.

(ප) රු.135,000,000 ක්වූ සීමාසහිත සීනෝර් ඔරියන්ට් පර්ල් සී ෆූඩ් අවන්හල පිහිටි රූඩ් 2 යි පර්චස් 12ක් වූ ඉඩම හා රු.115,000,000 ක්වූ මට්ටක්කුලිය යාත්‍රාංගනයේ බදු දී ඇති වර්ග අඩි 25,000ක ගබඩාව ප්‍රමිත 40 හි 75 හා 79 ඡේද ප්‍රකාරව ආයෝජන, වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු වෙනුවට, දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

(බ) 2020 දෙසැම්බර් 31 දිනට මත්තුමගල ඉඩමෙහි ආයෝජන ආදායම් ලෙස රු.2,700,000 ක් දක්වා තිබුණ ද එවැනි ආයෝජන වත්කමක් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. එසේම පදනම හා සීමාසහිත ෆ්‍රන්ටියර් ඔටෝ මෝටිව් (පුද්ගලික) සමාගම අතර වූ බදු ගිවිසුම අනුව මෙම ඉඩමෙහි අයිතිය ලංකා ධීවර සංස්ථාවට අයත් බව සඳහන් වුවත්, ලංකා ධීවර සංස්ථාව මඟින් මෙම ඉඩම සීමාසහිත සීනෝර් පදනම වෙත ලබාදීමට අදාලව හා තෙවන පාර්ශවයකට කුලී පදනමක් යටතේ පැවරීමට අනුමැතිය ලබාදීමට අදාල ලිඛිත සාක්ෂි නොවීය.

(ම) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි ඡේද අංක 120 අනුව සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් ගණනය කිරීමට යොදා ගත යුතු මූලික මූලධර්ම වන සේවක ප්‍රතිලාභ වියදම්වලට අදාළ වර්තමාන සේවා පිරිවැය, වර්ෂයට අදාළ පොළී පිරිවැය හා උපකල්පන වෙනස් වීම නිසා ඇති වූ ආයුගණක ප්‍රතිලාභ/අලාභ වගකීම හෙළිදරව් කර නොතිබුණු අතර ඡේද අංක 93අ අනුව උපකල්පන වෙනස් වීම නිසා ඇති වූ ආයුගණක ප්‍රතිලාභ/අලාභ වගකීම අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ හඳුනා ගෙන ද නොතිබුණි.

(ය) රු.1,961,850 ක ශ්‍රී බංගලාස් බෝට් බද්ධ ව්‍යාපාරයේ ආයෝජනය ජංගම නොවන වත්කම් යටතේ හා වෙනත් ගෙවිය යුතු ශේෂය තුළ හානිකරණ අලාභ ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල ගිණුම්ගත කර තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 හි 126 අනුව හානිකරණයට යටත් වූ වත්කම්වල ධාරණ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල හෙළිදරව් කළයුතු වුවත් එසේ දක්වා නොතිබුණු බැවින් ආයෝජන ලෙස දක්වා තිබුණු ශ්‍රී බංගලාස් බෝට්වල ආයෝජන අගය වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 පදනමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන පදනමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

පදනමේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්

තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඇ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පදනම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 පදනමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට පදනම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත (සංශෝධිත)	කිසියම් මාසයක සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ඊළඟ මාසයේ 15 දින හෝ ඊට පෙරදින ප්‍රේෂණය කළ වුවත් 2017 ජූලි සිට දෙසැම්බර් දක්වා වූ කාලයට අදාළ සේවක අර්සාධක අරමුදල් රු.36,740ක මුදලක් 2019 ජූනි මාසයේ සිට ප්‍රේශණය නොකර රඳවාගෙන තිබුණි.
(ආ)	1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත (සංශෝධිත)	කිසියම් මාසයක සේවක භාරකාරත්ව අරමුදලට දායක මුදල් ඊළග මාසයේ අවසාන දින හෝ ඊට පෙරදින ප්‍රේෂණය කළ යුතු වුවත් 2017 ජූලි සිට දෙසැම්බර් දක්වා වූ කාලයට අදාළ සේවක භාරකාර අරමුදල් රු.5,510ක මුදලක් 2019 ජූනි මාසයේ සිට ප්‍රේශණය නොකර රඳවාගෙන තිබුණි.

(ඇ)	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක පීඊඩී/12 හි 5.1.3 ඡේදය	2020-2024 වර්ෂ සඳහා වූ සංයුක්ත සැලැස්ම 2020 මූල්‍ය වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර විගණනයට ඉදිරිපත් කළයුතු වුවද 2020 ජුනි 19 දින ඉදිරිපත් කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර පදනමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

	බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
(අ)	සාංගමික සංස්ථා පත්‍රය 3.3 හා 3.5 ඡේද	සී/ස සී-නෝර් පදනම අයිස් නිෂ්පාදනය, සාගර නිෂ්පාදන පැකට් කිරීම, විකුණුම්කරණය සහ අපනයනය, මසුන් දැල් නිෂ්පාදනය කිරීම සහ බෝට්ටු නිෂ්පාදනය හා බෙදාහැරීම යන කටයුතුවල නිරත විය යුතු වුවත් ඉන් බැහැරව බෝට්ටු නිෂ්පාදනය පමණක් සිදුකර තිබුණෙන් පදනම පිහිටුවීමේ පරමාර්ථවලින් බැහැරව කටයුතු කරන බව නිරීක්ෂණය විය.
(ආ)	සාංගමික ව්‍යවස්ථාවලියේ 53 ඡේදය	වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු බව දක්වා තිබුණ ද 2018, 2019 හා 2020 වර්ෂවල එකී මහා සභා රැස්වීම් පවත්වා නොතිබුණි.
(ඇ)	සාංගමික ව්‍යවස්ථාවලියේ 58 ඡේදය	වාර්ෂික මහා සභා රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් පදනමේ සභාපතිවරයා පත්කළ යුතු වුවත් සභාපතිවරයා පත්කිරීම ඒ අනුව සිදුකර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර පදනමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව,

(අ) සීමාසහිත සී-නෝර් පදනමට අයත් නො.335 ඩී.ආර් විජේවර්ධන මාවත, කොළඹ 10 ලිපිනයෙහි පිහිටි හිස් ඉඩම 1998 ජූලි 04 දින සිට අවුරුදු 20ක කාලයක් සඳහා අවන්හලක් පවත්වාගෙන යාමට පෞද්ගලික සමාගමකට බදු දී තිබුණු නමුත් බදු ගිවිසුමෙහි කාලය ඉකුත් වීමෙන් පසුව පදනම විසින් රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව කටයුතු කිරීම නිසා ඇතිවූ අර්බුද හේතුවෙන් 2018 වර්ෂයේ සිට මේ දක්වා වූ වසර 2 කට අධික කාලයක් එම දේපලෙහි ආර්ථික ප්‍රතිලාභ අහිමි වී තිබුණි. එසේම පදනම විසින් 2018 වර්ෂයට අදාළව අදාල ආයතනයේ ලාභයෙන් රු.323,515 ක්වූ ලාභ කොටස අයකරගෙන නොතිබුණු අතර ඉඩම් සන්තකය ලබාගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටද සිදුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී තනතුරු 4 ක් සඳහා බඳවාගැනීම් වෙනුවෙන් වූ පුවත්පත් දැන්වීම් සඳහා එකතුව රු.109,080 ක් වැයකර තිබුණ ද 2021 නොවැම්බර් 30 දිනවන විටත් අදාල බඳවාගැනීම් සිදුකර නොතිබුණු හෙයින් වැයකළ රු. 109,080 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඇ) 2020 දෙසැම්බර් 31 දිනවන විටත් රු.31,572,644ක බැංකු අයිරාවක් පැවති අතර බැංකු අයිරා ලබාගැනීම වෙනුවෙන් 2020 වර්ෂය සඳහා රු.874,659 ක අයිරා පොලී ගෙවා තිබුණි. තව ද 2020 දෙසැම්බර් 31 දිනවන විට බැංකු ගිණුම් 4 ක හා අග්‍රිම ගිණුම් 2 ක එකතුව රු.9,189,907 ක හර ශේෂයක් පැවතීම නිසා එදිනට මුදල් හා බැංකු ශේෂය රු.22,382,735 ක බැංකු අයිරාවක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂය තුලදී අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියකින් තොරව එකතුව රු.3,653,360ක් වූ ණයහිමි ශේෂ 77ක් විවිධ ආදායම් ගිණුමට බැර කර තිබුණි.

(ආ) ගෙවිය යුතු තැන්පතු ගිණුමෙන් රු.1,950,258ක් කේවල ශේෂ ලැයිස්තුවක් පිළියෙල කිරීමකින් තොරව හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව විවිධ ආදායම් ගිණුමට බැර කර තිබුණි.

(ඇ) 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු.14,140,125 ක්වූ අත්තිකාරම් තුල 2003 වර්ෂයේ සිට 2018 වර්ෂය ,දක්වා කාලයට අදාල රු.8,878,264 ක්වූ අත්තිකාරම් ශේෂයන් පැවතිය ද අදාල ශේෂයන් අයකර ගැනීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ගයන් මේ දක්වා ගෙන නොතිබුණි.

(ඈ) මාළු දැල් නිපදවීමට පුද්ගලික ආයතනයකට උප කොන්ත්‍රාත් පදනම යටතේ 2011 වර්ෂයේදී ලබාදුන් අමුද්‍රව්‍ය වටිනාකමෙන් රු.4,909,775ක් අනෙකුත් ලැබිය යුතු දෑ ලෙස මූල්‍ය ප්‍රකාශනවල වර්ෂ 09ක කාලයක සිට අඛණ්ඩව පැවතියද අදාල ශේෂය අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් පදනම විසින් ගෙන නොතිබුණි.

